# ● කෙටි කතාව




කොන්ඩයක් හදා ගන්නවානම් හදා ගන්න ඕනෑ ඒ විදියටය රලු කොන්ඩය සතත ව්‍යායාම වලට කීකරුව තම වසඟයට ගැනීමට අය්යාට සෑහෙන කාලයක් ගත විය. කැපවීම තිබේනම් ඕනෑම දෙයක් ඉටු කර ගත හැකිය යන කියමන ඔප්පු වන්නේ අය්යාගේ කලින් තිබූ කොන්ඩයත් පස්සේ හදාගත් කොන්ඩයත් සසඳා බලන්නෙකුටය. එක බඩවැල කඩා ගෙන ආ මගේ අකීකරු ඉත්තෑකුරු කොන්ඩය ද මේ සසැඳීමට එක් කර ගත හැකිය.

ඇත්තටම අය්යා මේ කොන්ඩයට දුක් විඳි තරම් ?...... බාල කාලයේදී අප මෙන්ම පොල් තෙල් ගා මෙල්ල කර ගන්නට හැදූ කොන්ඩය පසුව තෙල් නොගා හරිහැටි නොපිරා හැඩපලු ගෙතෙන නොගෙතෙන ගානට තබා ගැනිමෙන් නොනැවතුනු අය්යා වරක් එය ක්‍රේල් කර ගෙන තාත්තාගෙන් හොඳටම බැනුම් ඇසුවේය. ක්‍රේල් ගතිය ගිය පසු ඔහුගේ කොන්ඩය අපිට සිහි ගැන්වූයේ තෙමිච්ච කුකුලකුගේ ස්වරූපයකි. ඇත්තටම අය්යාගේ කොන්ඩයේ කතාව නින්දා ගැරහිම් වැරදිම් පාසැලින් පන්නා දැමීම් ආදියෙන් සපිරිනු එකක් විය. ලේසියෙන් යාමට තිබූ හමුදා රස්සාවද මේ කොන්ඩය රැක ගැනිමට ගොස් අහිමි කර ගත් කෙනෙකි අපේ අය්යා.

නව යොවුන් විය පසු වන විට අය්යාගේ කොන්ඩය මේ බාධක සියල්ල මැඩ ගෙන හරි ලස්සනට සැකසී තිබුනි. එය ඇත්තටම හින්දි තීරයේ නලුවකුගේ කොන්ඩයකට සම කළ හැකි තරමට ලස්සන එකක් විය. අක් බමරු ගෙතී පිටුපසට ලස්සන රැලි රැලි ලෙස පීරුනු කොන්ඩය කුරුලැවක් දෙකක් මෝදු වෙමින් තිබුන අය්යාගේ මුහුනට කදිම කඩවසම් බවක් එක් කළේය. ඉක්මනට වැවෙන ඔහුගේ ඝන කොන්ඩයේ තිබුනේ අමුතුම දිප්තියකි.

මේ කොන්ඩයේ සත්කාර සඳහා හීන් කූරු සහිත පනා දෙකක්ම අය්යාගේ පිටි පස කලිසම් සාක්කු දෙකේ නිතරම සුදානමින් සිටියේය. ඔහු ඕනෑම හදිසියකට ගෙයින් එළියට බැස්සේ විනාඩි දහයක් පහලවක් කන්නාඩිය ඉදිරියේ ඒ මේ අතට හැරෙමින් එය පිරා ගැනීමෙන් පසුවය. අප දෙදෙනා ඉඳහිට එකට ගමනක් යාමට සූදානම් වන විට මගේ ඉවසිමේ සිමාව බිඳ ලෑමට ඔහුගේ මේ කොන්ඩා සැරසිල්ල නිතරම සමත් වෙයි.

මොකක්ද අය්යෙ ඔය මල සමයම? තව ටිකකින් බස් එක ගියොත් මොකද වෙන්නෙ? මම ඔහුගේ කාමරයට එබී බලමි. ඔහුට වගේ වගක් නැත. කන්නාඩියට වෙතට හිස එහාට මෙහාට හරවමින් කොන්ඩය සරසයි. දෙඅත්ල සීරුවෙන් කොන්ඩයේ දෙපැත්තටම විහිදුවයි. පොඩ්ඩක් හිටපං බං.......

ඕන වෙලාවක එන එකයි තියෙන්නෙ ඔන්න මං ගියා. මම එඩරු වැට ගේට්ටුවේ පොලු ඉවත් කරත්ම අය්යා දුව ගෙන දුව ගෙන එයි. මල පෙරේතයො වගේ පාරෙ යන්නද මට කියන්නෙ? බලපන් ඔය කොන්ඩෙ හැටි. මනුස්ස පාටකට පාරෙ පලයන්කො...

අය්යාට මිතුරන් රැසක් සිටි අතර ඔහුගේ කොණ්ඩයට වසිවූ පෙම්වතියෝද කිහිප දෙනෙක් ද වූහ. ඔවුන්ගෙන් දෙතුන් දෙනෙකු මම හඳුනා ගෙන සිටියෙමි. කොන්ඩයට කළ කැපවීම පාඩම් වැඩවලටත් ආදේශ කරීමට උනන්දුවක් ඔහු තුලින් පහල වූයේ නැත. මේ නිසාදෝ ඔහුට සාමාන්‍ය පෙලෙන් ගොඩවීමටද හැකි නොවීය.

එහෙත් අය්යා තුල බෙහෙවින් අසාමාන්‍ය ආත්ම විශ්වාසයක් තිබුන බව මට සහතිකය. ඔහුගේ මිත්‍රශීලි කථා විලාසයත් හිත හොඳ කමත් මේ හැමකටම වඩා අර අපූරු කොන්ඩයක් නිසා මිනිස්සු දෙවරක් නොසිතාම ඔහු හා මිත්‍ර වූහ. අහල පහල ගම්වල ගොයම් කයි හා ශ්‍රමදාන කඳවුරු වලට ඔහුගේ සහභාගිත්වය නිතරම පාහේ තිබුනේය.

ක්ලීන් සූටි..... එම්ටි පොකටි.... තාත්තාගේ දෙහි කැපිල්ල ඉඳහිට පටන් ගන්නේ ඒ විදියටය. බලපන් උඹ පවුලෙ ලොකු දරුව....මේ විදියට රස්තියාදු විකුන විකුන හත් වලාමෙ යනව මිසක්ක කවදද උඹ රස්සාවක් කරන්නෙ?

මට රස්සාවක් ලැබෙන්න යන්නෙ? අය්යා සෙමින් කියයි.

කොහේද? කවදද?......

අය්යා මොකක් හෝ තැනක නමන් කියා බේරෙයි. ලැබෙන වැටුප හරියටම ගණන් හදයි. කෙස් ගහෙන් අය්යාට හොරා වෙන කෙනෙකු ඩැහැ ගැනීමෙන් ඒ රැකියාවේ කතාවත් නිමාවක් දකී.

මෙබඳු සිද්ධි නිසා තෙම්පරාදු වුවත් අය්යා කිසි විටෙකවකත් කොන්ඩයේ සාත්තුව අතපසු නොකළේය. කවුරු හෝ නිසොල්මනේ බලාසිටියහොත් සිතනු ඇත්තේ ඔහුගේ මේ සාත්තුව දෙවැනි වන්නේ හුස්ම ගැනීමට පමණක් බවයි. එහෙත් ඔහුගේ තවත් පුරුද්දක් වූයේ පොත පත කියැවිමට දැක්වූ රුචියයි. ඔහුගේ කුඩා කාමරයේ පකිස් පෙට්ටි දෙකකින් අටවා ගන්නා ලද පොත් රාක්කයක පහත මාලයේ බොළඳ නවකතා ගණනාවක් තිබුනි. හැබැයි ඊට උඩ රාක්කයේ විවිධ පරිවර්ථන කෘතීන් විය. ඉතිහාසය හා දේශපාලනය සම්බන්ධ විවිධ පොත් ඒ අතර විය. මට හෝ මල්ලීට ඔහුගේ පොත් රාක්කය අසල ගැවසිම හෝ තහනම් කර තිබුනි. ඔහුගේ රසිකත්වයේ පරාසය මට සිතා ගැනීමට නොහැකි තරම් පලල් එකක් යැයි මට සිතුනු වාර අනන්තය. එය වරෙක බයිලා ගායනාවල සිට අමරදේවගේ මධුර ගීත දක්වා පුලුල් එකක් විය. එය ඔහුගේ කොන්ඩය මෙන් මනා හික්මීමකින් ප්‍රගුණ කළ යුතු එකකි. අය්යාගේ මේ හික්මීම මා මෙන් රජයේ විභාග සමත් වීමේ කාර්යය කෙරේ නොවිහිදුවිය. ඔහුගේ පොත්ගුල නනා පොත් වලින් පිරෙද්දී මම නීරස සටහන් කියවමින් උසස් පෙල විභාගය දක්වා දුව ගියෙමි. අන්තිමට අප දෙදෙනා එකිනෙකා ඈත් කරමින් අසබඩ නගරය සොච්චම් වැටුපක් ලැබෙන රැකියාවක් දෙන මුවාවෙන් මා ඩැහැ ගත්තේය. මේ නිසා මගේ නිවසේ වාසය සති අන්ත වලට පමණක් සීමා විය.

කල් යාමේදී අය්යාගේ කොන්ඩයට පලාතේ

**W.H. උපසේන**

මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් ලැබුනි. මට ඒ පුවත සැලවූයේ අම්මාගෙනි. යාන්තං ඇති ලොකූට මේ විදියට කල දවසක් උදාවුනා. අම්මා කීවේ සැනසිලි දායක ස්වරයෙනි. තාත්ත කතා බහක් නැතිව සිටියේ අම්මාගේ කීම අනුමත කරන්නාක් මෙනි. එයාට වරදක් වෙන එකක් නැහැ. මිනිස්සු කියන්නෙ මිනිහ දැන් මන්ත්‍රීතුමගේ දකුණු අත කියලලු.

ඇත්තටම අය්යාගේ කතා විලාශය කාගේ වුවත් සිත් ඇද ගන්නාසුලු එකක් විය. මන්ත්‍රීතුමාගෙන් පටන් ගෙන ඕනෑම ප්‍රධාන කථිකයකු එන තුරු සෙනග රඳවා තබා ගැනීමට ඔහු හොඳ මෙවලමක් වූ බව පෙනුනි. ඔහු තම පෞද්ගලික පුස්තකාලයේ බොළඳ නවකතා මෙන්ම අතරින් පතර කියැවූ ශාස්ත්‍රීය හා දේශපාලන ග්‍රන්ථ ඇසුරින් ගොඩනගා ගෙන තිබුනි ජනප්‍රිය කතා විලාශය යුගයේ සැබෑ අවශ්‍යතාවයක් විය. ඔහුගේ කතා දෙක තුනක් ඇසූ මට සිතුනේ මෙබඳු කතා විලාශයක් මට තිබුනා නම් කෙතරම් අපූරුද යන්නය. මහා වංශයෙන් පටන් ගන්නා කතාවක් අරාබි නිසොල්ලාසයෙන් සාරංශ ගත කිරීමට හැකියාව ඔහුට තිබුනි. සමහරවිට ඔහු කතාව ජනප්‍රිය බයිලා ගායනයකින් පටන් ගෙන ඕමාර බයියාම් ගේ කවකින් අවසන් කරයි. කතාව මැද්දී විරිඳුවක් කියයි....

"අය්යාගේ ව්‍යායාමයේ ප්‍රතිඵල ඉක්මණින්ම ලැබුනි. අපේ නිවස අලුත් වැඩියා වූ අතර අය්යා පැය විසිහතර පුරාම ජනතා සේවයේ නියැලිව සිටින්නට පටන් ගත්තේය. මන්ත්‍රීතුමා අය්යා රෙකමදාරු කළ අයගේ ඉල්ලීම් ගැන ඉක්මණින්ම අවධානය කළේය. අය්යාගේ කොන්ඩය වඩ වඩාත් ලස්සනට වැවෙන්නට පටන් ගත්තේය. එයට පෙරටත් වඩා මනා සාත්තුවක් ලැබුනි. සති අන්තයේ මන්ත්‍රී නිවසේ පෝලිම් දෙකක් විය. මුලින්ම අය්යා හමුවන්නට එන පෝලීමය. මන්ත්‍රීතුමා හමුවිය යුත්තේ ඔහුගේ රෙකමදාරුවෙන් පසුවය. සමහරු සන්තෝෂයෙන් හා මුවින් නොබැන ගිය අතර අතරින් පතර වුන් බැන බැන ම ගියහ. සිය නැගනිය සමග යාලුවන්නට යාමෙන් උරණව අය්යාට ඒ දවස්වල ගොන් පාට් එකක් දැමූ තරුණයෙක් ද මේ පෝලිමේ එක් දවස දකින්නට අපට හැකි විය.

අය්යා කිසිඳු වෙනසක් නොදක්වා ඔහුගේ වැඩය කර දුන්නේය. තැන්කිව් මචං....... තරුණයාට ඉබේම කියැවුනි. අය්යා අහක බලා ගෙන සිනහ වු අයුරු මට තවමත් මතක් වෙයි.

"කාර්යාලයක කුරුටු ගාමින් සිටි මටද අය්යා නිසා ප්‍රසිද්ධියක් ලැබුනි. බොහෝ අය මා හැඳින්වූයේ මගේ නමින් නොව අහවලාගේ මල්ලි වශයෙනි. ඔයාගෙ අය්යගෙ කොන්ඩෙ වගේම කතාවත් හරි ලස්සනයි.... අපේ කාරයාලයේ වැඩ කළ කාන්තාවෝ කිහිප දෙනෙක් ඔහු වර්ණනා කළේ එක වරක් පමණක් නොවේ. ඔවුන්ගේ ඇතැම් කොන්තරාත්තු භාර ගැනීමෙන් මම අය්යගෙන් කිහිප වරක්ම බැනුම් ඇසුවෙමි. මොනාද බං උඹ මේ ගේන කුණු ගොඩවල්....? මේවැයින් මමත් සවුත්තු වෙනව. ඒත් ඔහු හිත හොඳ මිනිසෙකි. මම සවුත්තු වනවාට ඔහුගේ කැමැත්තක් තිබුනේ නැත. හිටපන් පොඩ්ඩක් ඊළග ඉලෙක්ෂන් එක ඉවර වුනාම උඹටත් මම ප්‍රොමෝෂන් එකක් හදල දෙන්නං... එතකොට උඹට ඔතනින් අයින් වෙන්න පුලුවන්.........

අය්යා තරම් සරු කොන්ඩයක් මුඛරි කමක් මට තිබුනේ නැත. මේ නිසා මම මෙබඳු අවස්ථා වලදි මා තුල සතුටට වඩා තිබුනේ බියකි. වැරදිලාවත් මේ යකා මොකක් හරි හදල දුන්නොත් මං කොහොමද ඒකක් කර ගෙන ඉන්නෙ...මගේ උගුර වියලී යන සෙයක් දේ දැනෙයි. එහෙත් අය්යාට මගේ සිතැගි ගියා තවත් බැනුම් අසන්නට මගේ සිත ඉඩ නොදෙයි. නංගීට ගුරු පත්වීමක් ලබා දීමට ඒ වනවිටත් වැඩ පිළිවෙලක් ඔහු විසින් සකස් කොට තිබුනි.

එහෙත් සියල්ල කනපිට පෙරැලීමට වැඩිකාලයක් ගතවූයේ නැත. අය්යා මන්ත්‍රීතුමා සමග විරසක වී වෙනත් මගක යන්නය සැරසෙන පන මට දැන ගන්නට ලැබුනේ අහම්බෙනි. මුන්ට කොච්චර කලත් වැඩක් නැහැ බං අය්යා කීවේය. එයාගෙ න්‍යාය පත්තරෙන් පිට මොකුත්ම බැහැ. මේක හරියට හොඳ සැපට ඉන්න හිර කාරයෙකුට සමාන ජීවිතයක්. මං දමල ගහල ආව.... මං අය්යාගේ කොන්ඩය දෙස බලා සිටිමි. අය්යා කියන දෙය අනුමත නොකරන්නාක් මෙන් එය අනිත් පැත්තට සැලෙයි. එහෙත් එය තවමත් ලස්සනය. දේශපාලනය ප්‍රභාව නැති කමින් දෝ එහි දිස්නය මඳක් අඩුවක් ඇති බව මට සිත කියයි. මදැයි කෙල්ලගෙ පත්වීම හදා ගන්න වෙලාවක් බල බල හිටිය...අම්මා කීවාය. උඹ හදන්නෙ කලු ගල් එක්ක හැප්පෙන්න.

මේ වෙනසත් සමග අය්යාගේ මිතුරෝ කෙමෙන් කෙමෙන් ඈත් වූහ. අපේ කාරයාලයේ විසූ ඔහුගේ කොන්ඩය වර්ණනා කළ ඔහුගේ කතාවලට වශීවූ කාන්තාවෝ පවා මා දුටු ගොලු වූහ. ඇත්තටම මිනිස්සු බොහෝ වෙලාවට මට කලින් සුළඟ හමන දිසාව තේරුම් ගනිති. ආරක්ෂක පියවර වල් ගනිති. ඉතින් ඔහුගේ කොන්ඩයද කතාවද ඔවුන් අතර හුදු අතීත සුමිහිරි සිහිනයක් පමණක් වෙමින් තිබුනි.

මාස කිහිපයක්ම නිවසින් ඈත් ව සිටි අය්යා නැවත පැමිනෙන විට ආවේය. වඩාත් කෙසඟ සිරුරකින් යුතුවය. අම්මා ඔහු දෙස දුකින් බලා සිට සිය කිලිටි චීත්තයෙන් කඳුළු පිස දා ගත්තාය. කියන දේවල් අහන් නැතිව කර ගන්න වැඩ. තියෙන දෙයක් කාල ගෙදරට වත් වෙලා හිටපන්. මනස් ගාත වැඩ වලට අත පොවන්නෙ නැතිව අඩුගානෙ....

අය්යාගේ චර්යාව කෙමෙන් වෙනස් වන්නට පටන් ගත්තේය. ඔහු නිසාචරයකු බවට පත්විය. ඔහුගේ නව මිතුරන් පැමිනියේ අඩු තරමින් රාත්‍රී දහය හමාර වත් පසුවය. අය්යා රහසිගත දේශපාලන සංවිධානයක සාමාජිකයකු වි ඇති බව අප කවුරුත් දැන ගන්නා ඔහු ඒ මග ඔස්සේ බොහෝ දුර ගමන් කොට තිබුනි. මේ හමුවේ අම්මාගෙන් හා තාත්තාගෙන් එල්ලවූ විරෝධය ඔහු වගේ වගකට නොගත්තේය. වෙනස් නොවෙමින් පැවතියේ ඔහුගේ කොන්ඩා සාත්තුව පමණි.

ඔහු නිතර ගෙදර ද රැඳී නොසිටියේය. වරක් දෙවරක් අතමාරුවක් ඉල්ලා ගැනීම සඳහා මිතුරකු හෝ දෙදෙනෙකු සමග අපේ කාරයාලයට පැමිනි වග නම් මට මතක ඇත. මෙබඳු එක් අවස්ථාවක අපේ කැන්ටිමේ තේ පානයකට මම ඔවුන් කැඳවා ගෙන ගියෙමි. හොද්ද උකුවීම පිණිස පාන් පිටි යහමින් යොදා හදන පරිප්පු හොද්ද සමග ඔච්චු තලු මරමින් පාන් කෑහ. එය ඔහුත් මමත් එකට හිඳ අනුභව කළ අවසාන භෝජන සංග්‍රය විය.

මට ඔහු අවසාන වතාවට හමුවූයේ පොලීසියේදීය. එවකට පැවති ඇඳිරි නීතිය කැඩීම නිසා ඔහු රිමාන්ඩ් ගත කොට තිබුනේ තවත් තරුණයන් පිරිසක් සමගය. අය්යා සතුව තිබූ එම වස්තුව වූයේ මුත්‍රා කිරීමට ලග තබා ගත් ටින් එක පමණි. ඔවුන්ට පොලිස් බත ඇගට නාල්ලා ඇති බව වෙහෙසකර හා නිදිරමැරූ නෙත් වලින් හා තඩිස්සි වූ මුහුණු වලින් පෙනුනි. අය්යෙ මං බත් දෙක තුනක් ගෙනත් දෙන්නද කට්ටියට කන්න. මම සෙමෙන් ඇසීමි..... එපා චූටියො..... ඔහු මා දෙස සෙනෙහසින් බැලුවේය..... උඹට පුලුවන් නං මට උඹේ පනාව දීල පලයන්........

u.hewage@optusnet.com.au